# අන්තර්ගතය

## 1.නීතිය

1.1 නීතිය නිර්වචනය කිරීම.

1.2 නීතියේ කාර්ය භාරය

1.3 නීතියේ ප්‍රයෝජන

## 2.ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය

2.1 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය හා නීති ක්‍රමය

2.2 නීති ක්‍රමයට නීති එකතු කරන නීති මූලාශ්‍ර

2.3 ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රමය

2.4 නීති වර්ගීකරණය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 3.ළමයා

3.1 ළමයාගේ ස්වරූපය

3.2 ළමයා හා ගුරුවරයා අතර සම්බන්ධතාව

3.3 ළමා අයිතිවාසිකම්වලට බලපාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

3.4 ළමා අයිතිවාසිකම්වලට බලපාන අපරාධ නීතිය

3.5 ළමා අයිතිවාසිකම් - පවුල් නීතිය

දිලික්ත නීතිය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 4. ගුරුවරුවන අපට වැදගත් වන නීති සමහරක්.

4.1 සුරක්ෂිත ළමා ලොවක්

4.2 නොසැලකිල්ල සම්බන්ධ නීතිය

4.3 අන්තර්ජාල අපරාධ

4.4 ගෘහස්ත ප්‍රචණ්ඩත්වය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නීතිය යනු....

නීතිය යනු කිසියම් ජනසමූහයකගේ හැසිරීම පාලනය කරන රීති සමූහයක්ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නීතියේ කාර්ය භාරය.

රිචර්ඩ් බෲස්ට අනුව නීතියේ කාර්ය මෙසේය.

නීතිය : -

1.සාමූහිකව ජීවත්වන ජන සමූහයක ඔවුන් විසින් ඉටු කිරීමට බැඳී සිටින යුතුකම් හා වගකීම් ඉටු කරවා ගැනීමට වගබලා ගනී.

2.නීතිය සමාජවිරෝධී ක්‍රියා මැඩලමින් ජීවත් වීමට හිතකර සමාජ පරිසරයක් ගොඩනගයි.

3.නිදහස සුරක්ෂිත කරයි.

4.සමාජ ක්‍රමයක් තුළ පුද්ගලයන්ගේ හැසිරීම , චර්යාධර්ම ආදියට මඟ පෙන්වන මූලධර්ම සමූහයකි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නීතියේ ප්‍රයෝජන.....

1. අපරාධ පාලනය
2. නීතිය පාලකයන් අත්තනෝමතික වීම වළක්වයි
3. සමාජ ක්‍රමය තුළ ජීවත්වන තැනැත්තා අන් අය කෙරේ සැලකිලිමත් වීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ආණ්ඩු ක්‍රමය හා නීති ක්‍රමය


## ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව

- ව්‍යවස්ථාදායකය හෙවත් නිති පැනවීම
  - පාර්ලිමේන්තුව
    - පළාත් සභා
      - අභියෝජන නීති පැනවීමට බලය ලත් වෙනත් ආයතන
- විධායකය හෙවත් නීතිය ක්‍රියාවට නැගීම
  - ජනාධිපති
    - කැබිනට් මණ්ඩලය
      - රාජ්‍ය සේවය
- අධිකරණය හෙවත් නීතිය නීත්‍යානුකූලව ක්‍රියාවට නැගීම වග බලා ගැනීම
  - ශ්‍රේෂ්ඨාධිකරණය
    - අභියාචනාධිකරණය
      - මහාධිකරණය
        - දිසා අධිකරණය
          - මහේස්ත්‍රාත් අධිකරණය
            - ප්‍රාථමික අධිකරණය
  - අධිකරණයෙන් බැහැර මැදිහත්වීමේ වෙනත් ආයතන

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නීති හා නීති වර්ගීකරණය

## හරවත් නීතිය හා පටිපාටික නීතිය



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# විවිධ නීති ක්‍රමවලින් ආභාෂය ලබා නීති ක්‍රමයට එකතු වූ නීති

රෝම ලංදේසි නීතිය →
- දිලික්ත නීතිය / තෝරත නීතිය
- පවුල් නීතිය / පුද්ගල නීතිය
- ගිවිසුම් නීති
- දේපළ නීති

ඉංග්‍රීසි නීතිය →
- අපරාධ නීතිය
- සාක්ෂි නීතිය
- පරිපාලන නීතිය
- විවිධ අණපනත් හා ව්‍යවස්ථා නීති

රෝම ලංදේසි නීතිය → වාණිජ නීතිය

විශේෂ නීති

උඩරට නීතිය → උඩරට විවාහ හා දික්කසාද නීතිය

මුස්ලිම් නීතිය → මුස්ලිම් විවාහ හා දික්කසාද නීතිය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නීති ක්‍රමයට නීති එකතුවන නීති මූලාශ්‍ර

නීති  ක්‍රමයට නීති එකතුවන ප්‍රධාන නීති මූලාශ්‍ර 2කි.එනම්,

1.නීතිකරණය හෙවත් නීති පැනවීම

2.නඩු නීති හෙවත් අධිකරණ පූර්ව නිදර්ශන

මෙම ප්‍රධාන නීති මූලාශ්‍ර දෙක හැර නීති ක්‍රමයට නීති එකතුවන තවත් අප්‍රධාන මූලාශ්‍ර ද කිහිපයකි.එනම්,

3.සිරිත්

4.ආගම්

5.නීති විශාරදයන්ගේ මත

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 1. නීති මූලාශ්‍රයක් ලෙස නීතිකරණය

- නීතිකරණය
  - ප්‍රධාන ව්‍යවස්ථාදායකය හෙවත් පාර්ලිමේන්තුව
    - පාර්ලිමේන්තු පනත්
      - පොදු පනත්
      - පෞද්ගලික පනත්
      - විශේෂ පනත්
  - පාර්ලිමේන්තුව පනත් මගින් නීති පැනවීමේ බලය පැවරූ ආයතන
    - පළාත් සභා
    - පළාත් පාලන ආයතන
    - අභිනියෝජන නීති
      - පළාත් සභා විසින් පළාත් සභා ලැයිස්තුවට අනුකූලව පනවන ප්‍රඥප්ති
      - පාලන ආයතන වැනි අතුරු නීති පැනවීම බලයලත් ආයතන පනවන අතුරු නීති රෙගුලාසි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **පෞද්ගලික පනත්**
  - පෞද්ගලික පනත්
  - පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ පනත්

- **විශේෂ පනත්**
  - 122 යටතේ හදිසි පනත්
  - සමගාමී ලැයිස්තුවේ
  - ව්‍යවස්ථා සංශෝධනය
  - ජනමත විචාරය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## ළමයාගේ හිමිකම්වලට බලපාන නීති පද්ධතිය

- නීති
  - නීති
    - පොදු නීති
    - පෞද්ගලික නීති
  - නීති විධිවිධාන
    - අපරාධ
    - සිවිල්
- රෙගුලාසි
  - ආයතන සංග්‍රහ රෙගුලාසි
  - මුදල් රෙගුලාසි
- චක්‍රලේඛ නියමයන්
  - අධ්‍යාපන අමාත්‍යාංශයේ රෙගුලාසි
  - වෙනත් රෙගුලාසි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නඩු තීන්දු නීතිය යනු කුමක්ද ?

නම් ඉංග්‍රිසි යෙදුමෙන් ද නඩු නීතිය නැතහොත් නඩු තීන්දු නීතිය යනුවෙන් සිංහලෙන්ද හඳුන්වන නීති මූලාශ්‍රය නීති ක්‍රමයට එකතු කරන ඉතා වැදගත් නීති මූලාශ්‍රයක් වේ.ඉහළ අධිකරණයක පෙර විනිශ්චයට භාජනය වූ නඩුවක නඩු තීන්දුවක නීතියට අදාළ කරුණු,එම කාරණයට සමාන පසුකලෙක නඩුවක දී නීතිය වශයෙන් භාවිතා වීම මෙම නීති මූලාශ්‍රයෙහි මූලික ලක්ෂණය වේ.

පෙර නඩුවක විනිශ්චයක් පසුව නඩුවක් සඳහා නීතිය වශයෙන් භාවිතා වීම හේතු කොට මෙම නීති මූලාශ්‍රය විනිශ්චයක පූර්වගමනය නැතහොත් අධිකරණ පූර්ව නිදර්ශන නමින් හඳුන්වයි.Precedent යන්න මේ සඳහා භාවිතා වන ඉංග්‍රිසි යෙදුම වේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# අධිකරණ පූර්ව නිදර්ශන නීතිය වශයෙන් භාවිතා කිරීමේදී පරිපූර්ණ කළ යුතු අවශ්‍යතා

අධිකරණ පූර්ව නිදර්ශන ලෙස භාවිතා කිරීම සඳහා පහත සඳහන් අවශ්‍යතා පරිපූර්ණ කළ යුතු බව නීති විශාරදයෝ දක්වති.එනම්:

1. අධිකරණ ආයතන යනු පිළිවෙළක් හෙවත් ඉහළ සිට පහළට ධුරාවලියකින් යුක්ත විය යුතුය
2. ක්‍රමවත් ලෙස නඩු තීන්දු වාර්තා කිරීමේ ක්‍රමයක් තිබිය යුතුය.

# පූර්ව නිදර්ශන ලෙස භාවිතා කිරීමේදී අනුගමනය කරන ක්‍රම පිළිවෙත්

ඉහළ සිට පහළ ලෙස ධුරාවලියකින් යුක්ත වූ අධිකරණ ක්‍රමයක් තුළ ,කිසියම් අධිකරණයක පෙර තීන්දු,පසු අධිකරණයක නීති මූලාශ්‍රයක් වශයෙන් භාවිතා කිරීමේ දී අධිකරණ ක්‍රමය තුළ ක්‍රියාත්මක වන ක්‍රම පිළිවෙළෙහි මූලික ලක්ෂණ මෙසේය.

ඉහළ අධිකරණවල තීන්දුවලින් පහළ අධිකරණ බැඳි සිටියි.පහළ අධිකරණයක තීන්දු ඉහළ අධිකරණය කෙරෙහි බැඳීම් ඇති නොකරයි

II. මේ අනුව ඉහළ අධිකරණය වූ ශ්‍රේෂ්ඨාධිකරණ,අභියාචනාධිකරණය හා මහාධිකරණය ආදී ඉහළ අධිකරණවල තීන්දු නීතිය වශයෙන් අනුගමනය කිරීමට දිසාධිකරණය හා මහේස්ත්‍රාත් අධිකරණය ආදී මුල් අවස්ථා අධිකරණ බැඳි සිටියි.

III. එමෙන්ම ඉහළ ම අධිකරණය වූ ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙර තීන්දු නීතිය වශයෙන් අනුගමනය කිරීමට අභියාචනාධිකරණය හා මහාධිකරණය බැඳී සිටියි. අභියාචනාධිකරණයේ පෙර තීන්දු නීතිය වශයෙන් අනුගමනය කිරීමට මහාධිකරණය බැඳී සිටියි.

iv. මුල් අවස්ථා අධිකරන ලෙස සලකන පහළ අධිකරණවල පූර්ව නඩු තීන්දු,නව නීති වාර්තා ආයි මාර්ගවලින් ක්‍රමවත්ලෙස වාර්තා කිරීමක් සිදුනොවන නිසා එම තීන්දු පූර්ව නිදර්ශන වශයෙන් භාවිතා කිරීම පිළිබඳව ප්‍රශ්නයක් පැන නොනගියි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

v. කිසියම් ඉහළ අධිකරණයක් ඒ සමාන වූ ඉහළ අධිකරණයක තීන්දුවලින් බැඳී නොසිටියි.

උදා: වර්තමාන අභියාචනාධිකරණයක අතීත අභියාචනාධිකරණයක පෙර තීන්දුවක් නීතියක් වශයෙන් අනුගමනය කිරීමට බැඳී නොසිටියි

Vi. එහෙත් ඉහළම අධිකරණ වූ ශ්‍රේෂ්ඨාධිකරණය පිලිබඳ විශේෂත්වයක් වේ.එම විශේෂත්වය මෙසේය:

කිසියම් ශ්‍රේෂ්ඨාධිකරණයක පෙර තීරණය පූර්ණ අධිකරණයක මගින් දුන් තීරණයක් නම් ඉන්පසු සියළු අවස්ථාවල ශ්‍රේෂ්ඨාධිකරණය එම පෙර තීරණයෙන් බැඳී සිටියි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙර තීරණය පූර්ණ අධිකරණයක් මගින් දුන් තීරණයක් නොවූ විට එම තීරනයෙන් බැඳීමේ බලය නිශ්චය වන්නේ පෙර තීරණය දුන් විනිසුරු මඩුල්ල හා පසු අවසන් විනිසුරු මඩුල්ලේ සංඛ්‍යාව අනුවයි.

නඩු තීන්දුව
- ආගන්තුක ප්‍රකාශය
- තීරණයේ හරය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සිරිත් නීතිය මූලාශ්‍රයකි...

1.යම් දෙයක් යමෙක නිතරම කරන විට එය ඔහුගේ දෛනික ජීවිතයේ කොටසක් බවට පත්වේ.එවිට ඒය ඔහුට හා ඔහුට සමීපයේ සිටින අයට බලපෑමක් කරයි.නමුත් සමාජයේ වැඩි පිරිසක් යම් විශේෂ දෙයක් නිතරම කරන විට සමාජයේ අනිත් සාමාජිකයන්ටත් ඒ සම්බන්ධව ක්‍රියා කිරීමට සිදුවේ.ඔවුන් එම දෙය පිළිගැනීම සමාජ තත්ත්වය මත රදා පවතියි.පිළිගතහොත් එය සිරිතක් බවට පත්වේ › ලංකා නීති විදයාල ශිෂය සංගමය ප්‍රකාශනයකින්.

2.සිරිතක් යනු වැඩි දෙනාගේ කැමැත්ත හේතුකොට පිළිගැන්මට ලක්වූ අයිතිවාසිකමක් හෝ යුතුකමක් වශයෙන් සරලව හැදින්විය හැක.සිරිත් පැරණිම නීති මූලාහායයි.සිරිතක් නීතියක් වශයෙන් පොදුවේ (මුළු මහත් රටට බලපාන්නා වූ) නීතියක් නැතහොත් කිසියම් ප්‍රදේශයකට බලපාන නීතියක් විය හැක.(Bruce Richard,(191:7)

ඉහත දක්වා ඇති ලෙස ඇතැම් සිරිත් ද නීති වශයෙන් නීති ක්‍රමයට එකතු වේ.එහෙත් සිරිතක් නීතියක් වීමට අධිකරණය ඒය නීතියක් වශයෙන් පිළිගැනීම අවශ්‍ය වේ.තවත් විදියකින් කිවහොත් සිරිතක් නීතියක් බවට පත්වන්නේ එම සිරිත නීතියක් වීමට අවශ්‍ය කොන්දේසි සපුරා ඇති බව අධිකරණ තීරණය කළහොත් පමණි.

# සිරිත නීතියක් බවට පත්වීම

සිරිත් නීති බවට පත්වීම දෙආකාරයකින් සිදුවේ.

**1.විධිමත් නීති මූලාශ්‍රයක් ලෙස පිළිගැනීම.**

නීතියක් වීමට අවශ්‍ය කොන්දේසි සපුරාලන හෙයින් සිරිත් නීතියක් බවට පත්වීම

**2.ආවයමය නීති මූලාශ්‍රයක් ලෙස සිරිත් උපයෝගී කරගෙන නීති සම්පාදනය කිරීම**

මෙහිදී සිදුවන්නේ ව්‍යවස්ථා හෝ පූර්ව අධිකරණ තීන්දු මගින් නීතිමය බලය ලබාදීමයි.සිරිත මූල ආව්‍යයක් ලෙස භාවිතා කර නීතියක් ඇති කිරීමයි.

උදාහරණ :

- Mercer Vs Denne (1905)එංගලන්තයේ නඩුවකි.

ධීවරකුට වෙනත් අයෙකුට අයිති වෙරළ තීරයේ තම මාළු දැල් වේලා ගැනීමට නීතියෙන් අයිතියක් ඇති බව අභියාචනාධිකරණය තීරණය කරන ලදී.මේ නිසා වෙරළ තීරයේ ගොඩනැගිලි සෑදීම නොකළ යුතු බවත් එමගින්,ධීවරයන්ගෙ හිමිකම් උල්ලංඝනය නොකර ලෙසත් අධිකරණය දන්වන ලදී.

- Egerton Vs Harding,(1905) එංගලන්තයේ නඩුවකි.

පොදු තණ බිමේ කැවීමට මුදාහළ ගවයෝ යාබදව පිහිටි පැමිණිලිකරුගේ ඉඩමට ඇතුලුව ආලපාලු කරති.අලාභය ඉල්ලයි.වැටක් බැද තම ඉඩම ආරක්ෂා කර ගැනීම සිරිතක්ව පැවති බවත්,ඒ නිස පැමිණිලිකරු සිය වගකීම ඉටු නොකිරීමෙන් හානිය සිදු වී ඇති බවත් අධිකරණය තීන්දු කරයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සිරිතක් නීතියක් වීමට සපුරාලිය යුතු කොන්දේසි.

1.සිරිත මතක තිබෙන කාලයේ පටන් පැවත ආ යුතු වීම.

2.සිරිත නොකඩවා භාවිතා කර තිබිය යුතුවීම.

3.අයිතිවාසිකම් ලෙස භාවිතා කර තිබිම

4.සිරිත සාධාරණ වීම

5.සිරිත පොදු නීතියේ මූලික ප%තිපත්තිවලට පටහැනි නොවීම.

6.සිරිත ව්‍යවස්ථාවන්ට පටහැනි නොවීම.

7.එම ප්‍රදේශයේ පවතින වෙනත් පිළිගත් සිරිත් සමග නොගැටීම.

8.සිරිත බලපාන ප්‍රදේශය ස්ථිර වීම.

- සිරිත යුක්ති සහගතවීම හා සාධාරණ වීම අවශය වේ.
- සිරිත පොදු නීතියට - ව්‍යවස්ථාවන්ට පටහැනි නොවිය යුතුයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නීති මූලාශ්‍රයක් ලෙස ආගම්

ඇදහිලි,විශ්වාස හ ආගම් නීති මූලාශ්‍ර වශයෙන් ඉතා පැරණි සමාජයේ බෙහෙවින්ම වැදගත් විය. නීති ක්‍රමය වඩාත් විධිමත්ව ඇති වර්තමානයේ පවා ආගමික නීති රීති,නීති ක්‍රමය වශයෙන් භාවිතා වන රටවල් ගණනාවක් වේ.

... ලංකාවේ ද නීති ක්‍රමය සංවර්ධනය වීමේදී බුද්ධාගම,හින්දු ආගම හා ඉස්ලාම් ආගම ආදී ආගම්වලින් පෝෂණය වූ අවස්ථා ගණනාවකි.

උදාහරණය -

**1.**බෞද්ධ විහාර දේවාල ගම් පනත හ මුස්ලිම් නීතිය හ පවුල් නීතිය ආදියට සම්බන්ධ නීතිකරණයේදී  ආගම්වලින් ආභාෂය ලබා ඇත.

2.ආගමික සිද්ධස්ථාන මුල්කරගත් දේපළ හා හිමිකම් සම්බන්ධ ගැටළු විසඳීමේදී අධිකරණය ආගමික මතිමතාන්තර,රීති සැලකිල්ලට ගනියි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නීති රචකයන්ගේ මත හා නීති පාඨ ග්‍රන්ථ නීති මූලාශ්‍ර ලෙස වැදගත්කම

අපරටේ නීතිය සම්බන්ධයෙන් සලකන කල 16 වන ශත වර්ෂයේ සිට 19 වන ශත වර්ෂ දක්වා ජීවත් වූ ලන්දේසි නීතිවේදීන්ගේ මත හා ග්‍රන්ථ නෛතික මූලාශ්‍ර වශයෙන් වැදගත් විය.ඉංග්‍රිසීන් උඩරට ප්‍රදේශ අයත් කරගත් පසුව එම ප්‍රදේශයේ පැවති නීතිය සම්බන්ධයෙන් ඉංග්‍රිසි රචකයින් විසින් ලිය ඇත ග්‍රන්ථයන් ද,නීති මූලාශ්‍ර වශයෙන් සලකන ලදී.

**රෝම - ලංදේසි නීති රචකයෝ**

- හිගුගෝ ග්‍රේෂස් (1583-1645)
- වැන් ග්‍රේවැන්ගන් (1613-1743)
- සයිමන් වැන් ලියුවන් (1625-1682)

කොර්නේලිස් වැන් බින්කර්ෂූක් (1673-1743)

වැන් ඩර් කීසෙල් (1730-1816)

ජොහැන්ස් වැන් ඩර් ලින්ඩන් (1756-1875)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රමය

ඉහළ අධිකරණ

- ශ්‍රී ලංකා ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය
- ශ්‍රී ලංකා ජනරජයේ අභියාචනාධිකරණය

→ ජ්‍යෝෂ්ඨ අධිකරණ

---

මුල් අවස්ථා අධිකරණය

- ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය
- දිසා අධිකරණය
- පවුල් අධිකරණය
- මහෙස්ත්‍රාත් අධිකරණය
- ප්‍රාථමික අධිකරණය

→ අධිකරණ විනිශ්චය අධිකාරී හා ආයතන

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ශ්‍රේෂ්ඨාධිකරණය(supreme court )

1. හැඳින්වීම : උත්තරීතර හා අවසානාත්මක ලේඛනෝපගත කිරීමේ (court of Record)–ශ්‍රේෂ්ඨ අධිකරණයයි .

මුල් අධිකරණ බලය හා අභියාචනාධිකරණය බලය දෙවර්ගයටම ගැනෙන බලතල හිමි වේ .

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 118 ව්‍යවස්ථාවේ ශ්‍රේෂ්ඨාධිකරණය බලතල ද 119 හි සංයුතියද 120-136 කාර්යයන් දැක්වේ .

2. සංයුතිය : අග්‍ර විනිශ්චයකාරවරයා 6 දෙනෙකුට නොඅඩු දස දෙනෙකුට නොවැඩි විනිශ්චයකරුවන්ගෙන් සමන්විත වේ .

3. පත් කිරීම : අග්‍ර විනිශ්චයකාරවරයා ද , අභියාචනාධිකරණය සභාපතිවරයා , ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණය විනිශ්චයකාරයින් ජනරජයේ ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ අධිකාර පත්‍රයක් මගින් පත් කරයි . ( ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව 107 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල හා කාර්යයන්

120 ව්‍යවස්ථාව : ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව පිළිබදව අධිකරණ බලය

125 ව්‍යවස්ථාව : ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය

126 ව්‍යවස්ථාව : මූලික අයිතිවාසිකම් හා භාෂා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ අධිකරණ බලය

127 ව්‍යවස්ථාව : අවසාන අභියාචනාධිකරණ බලය

128 ව්‍යවස්ථාව : අභියාචනාධිකරණ තීන්දුවකින් අතෘප්තිමත් වූ පාර්ශවයක් සම්බන්ධ අභියාචනා කිරීමේ බලය .

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

129 ව්‍යවස්ථාව : උපදේශක අධිකරණ බලය

130 ව්‍යවස්ථාව : පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීම සම්බන්ධව වැරදි වලට අදාළ නඩු විභාග කිරීමේ බලය

136 ව්‍යවස්ථාව : අධිකරණ රීතී සම්පාදනය කිරීමේ බලය

1978 අංක 02 දරණ අධිකරන සංවිධාන පනතේ 40 වගන්තිය අනුව ,

යහපත් කීර්තියක් මහා දැනුමක් හා දක්ෂතාව ඇති තැනැත්තන් නීතිඥ වෘත්තියට බඳවා ගැනීම

ඔවුන්ගේ විනය පාලනය

සේවයෙන් පහ කිරීම හෝ සේවය අත්හිටුවීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# අභියාචනාධිකරණය-The court of Appeal

1. **හැඳින්වීම** : මුල් අවස්ථා අධිකරණ , විනිශ්චය අධිකාර හා වෙනත් ආයතන විසින සිද්ධි පිළිබඳව හෝ නීතිය

   පිළිබඳව හෝ කරනු ලබන සියලුම වැරදි නිවැරදි කිරීම සඳහා වූ අභියාචනය , පරිශෝධනය හා යථා තත්වයට පත් කිරීම සඳහා වූ අධිකරණය .

   ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 138 - 145 වගන්ති වල අභියාචනාධිකරණ බලතල විස්තර වේ .

2. **සංයුතිය** : ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන විනිශ්චයකරුවන් හා පත් කිරීම 6 දෙනෙකුට නොවැඩි විනිශ්චයකරුවන්ගෙන් සමන්විතයි .

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 3 . අභියාචනාධිකරනයේ බලතල හා කාර්යයන්

138 ව්‍යවස්ථා : මුල් අවස්ථා අධිකරණයන්ගේ අභියාචනා විභාග කිරීම එම අධිකරණ විසින් සිදු කොට ඇති නීතිය හා සිද්ධිය පිළිබඳ වැරදි නිවැරදි කිරීම .

මුල් අවස්ථා අධිකරන වාර්තා විභාග කොට පරිශෝධනය කිරීම ( Rivision)

වංචාවක් වැරදීමක් නිසා සිදු වූ වැරදි නඩු තීන්දු යථා තත්වයට පැමිණිවීම .

140 ව්‍යවස්ථාව : මුල් අවස්ථා අධිකරණය හෝ වෙනත් ආයතනයක වාර්තා සෝදිසි කිරීමට සහ පරීක්ෂා කිරීමට ද නීතිය අනුව ,

- සර්ටියෝරාරි Certiorari — තහනම් Prohibition
- ප්‍රොසිඩෙන්ඩෝ Procedendo — මැන්ඩාමුස් Mandmus
- ක්වෝ වොරෙන්ටෝ Quo Warranto

# රිට් ආඥා ප්‍රදානය කිරීම හෝ නිකුත් කිරීම

141 ව්‍යවස්ථාව : හබයාස් කොපුස් ආඥා නිකුත් කිරීමේ බලය .

142 ව්‍යවස්ථාව : සිරකරුවන් ගෙන්වා ගැනීමේ හා ඉවත් කිරීමේ බලය

143 ව්‍යවස්ථාව : ඉන්ජන්සන් තහනම් ( ෂබවමබපජඑසදබ) නිකුත් කිරීමේ බලය .

144 ව්‍යවස්ථාව : පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය

145 ව්‍යවස්ථාව : පහළ අධිකරණයක විභාග පවමින් පවතින හෝ විභාගය අවසන් කල නඩු වාර්තා පරීක්ෂා කිරිම , පරිශෝධනය කිරීම හා වැරදි තීන්දු ඉවත් කිරීමේ බලය

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති බලතල වලට අමතරව

පහළ අධිකරණයක සිට වෙනත් අධිකරණයකට නඩු මාරු කිරීමේ බලය

අපරාධ නඩු විධි විධාන සංග්‍රහය යටතේ හා පීඩාකාරි ආයුධ ආඥා පනත යටතේ වරදක සැකකරුවෙකුට ඇප නියම කිරීම , ඇප වෙනස් කිරීමේ බලය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 4 . පළාත් බද මහාධිකරණය

13 වන ආණ්ඩු ක්‍රම සංශෝධනය අනුව 154 ව්‍යවස්ථාව මගින් පළාත් බද මහාධිකරණයට බලය ලබා දී ඇත .

පළාත් බද මහේස්ත්‍රාත් අධිකරණය හා ප්‍රාථමික අධිකරණය විසින් වරදකරු කරනු ලබන දණ්ඩන නියමයන් හා ආඥාවන් සම්බන්ධ අභියාචන හා ප්‍රතිශෝධන බලය පළාත් බද මහාධිකරණයට හිමි වේ .

පළාත් බද මුල් අවස්ථා අධිකරණ පරිපාලනය සම්බන්ධය පරීක්ෂා කර වාර්තා කිරීමේ බලය අධිකරණ සේවා කොමිසම විසින් මහාධිකරණයට පැවරිය හැක .

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රමය
# මුල් අවස්ථා අධිකරණ

## මුල් අවස්ථා අධිකරණ

1978 අංක 2 දරණ අධිකරණ සංවිධාන පණත අනුව , ශ්‍රී ලංකා ජනරජයේ යුක්තිය පසිඳලීම සඳහා පහත දැක්වෙන මුල් අවස්ථා අධිකරණ විය යුතුවේ .

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය

(ආ) දිසා අධිකරණය

(ඇ) පවුල් අධිකරනය

(ඈ) මහේස්ත්‍රාත් අධිකරණය

(ඉ) ප්‍රාථමික අධිකරණය

# මහාධිකරණය - The High Courts

## 1. හැඳින්වීම

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 111 (1) , 13 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනය , 138 (1) 1978 අංක 2 දරණ අධිකරණ සංවිධාන පනතේ 9 -18 වගන්ති , අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 10 ,11,12,13,15,17,18 වගන්ති අදාල වේ .

## 2. බලතල හා කාර්යය

1 " අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කරන්නා වූ ද , නීතියෙන් පිහිටවනු ලද්දා වූ ද ඉහළම මුල් අවස්ථා අධිකරණය ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය වේ . පාර්ලිමේන්තුව විසින් නීතියෙන් පවරනු ලබන හෝ නියම කරනු ලබන අධිකරණ බලතල එම අධිකරණය විසින් ක්‍රියාත්මක කරයි ."

11 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත යටතේ දක්වා ඇති වැරදි සම්බන්ධ නඩු විභාග කිරීමට තීරණය කිරීමට , ලිඛිත නීතියෙන් නියමිත දඬුවම් දීමට මහාධිකරණයට බලය ඇත .

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# දිසා අධිකරණ - The District Courts

## 1 . හැදින්වීම

සෑම අධිකරණ දිස්ත්‍රික්කයකම ලේඛනෝපගත කිරිමේ දිසා අධිකරණයක් විය යුතු වේ .

දිසා අධිකරණ සිවිල් නඩු සම්බන්ධ මුලික අධිකරණයයි .

## 2. පත් කිරීම

දිසා අධිකරණ විනිශ්චයකාරවරුන් අධිකරණ සේවා කොමිෂන් සභා විසින් පත් කරනු ලැබේ .

## 3 . බලතල හා කාර්යය

1. සිවිල් ආදායම් , භාර , වස්තු භංගත්වය හා තෙස්තමේන්තු යන කාරණා සම්බන්ධ ලිඛිත නීතියකින් යම් අධිකරණයකට හෝ වෙනත් බලධරයකු සතු කර දෙන කාරණා හැර අනිකුත් කාරනා සම්බන්ධ මුල් අධිකරණ බලය , දඩ , දණ්ඩන , රාජසන්තක කිරීමේ බලය , ස්වකීය අධිකරණ දිසාව තුළ දිසා අධිකරණයට හිමි වේ .

එනම් ,

මුග්ධයින් , සිහිවිකල තැනැත්තන් , මානසික හෝ කායික දුබලතාවය නිසා තම කටයුතු බලා ගැනිමට පාලනය කිරීමට නොහැකි තැනැත්තාගේ පෞද්ගලික භාරකාරත්වය හා ඔවුන්ගේ දේපල භාරකාරත්වය .

තෙස්තමේන්තු අධිකරණ බලය : අන්තිම කැමති පත්‍ර ආදී

1981 අංක 71 පනතේ සංශෝධනය අනුව පවුල් අධිකරණ බලය

වෛවාහක ආරවුල් , දික්කසාද , අනාචාර , වැරදි , වෛවාහක දිමනා , සුජාතභාවය හා අවජාත භාවය තීරණය කිරීමේ බලය

## 4 . දිසා අධිකරණ තීන්දුවට එරෙහිව අභියාචනා කිරීම

දිසා අධිකරණ නඩු තීන්දුවකින් හෝ ආඥාවකින් අතෘප්තියට පත් පාර්ශවයකට නීතිමය සිද්ධිමය දෝෂයක් මත අභියාචනාධිකරණයට අභියාචනා කළ හැක .

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පවුල් අධිකරණය - The Family Courts

1 . පවුල් නීතියට සම්බන්ධ තනි මුල් අධිකරණය වේ .

2 . 1978 අංක 1 දරණ පනතේ සංශෝධන අනුව පවුල් අධිකරණ බලතල දැන් දිසා අධිකරණය ක්‍රියාත්මක කරයි .

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# මහේස්ත්‍රාත් අධිකරණ - The Magistrates Courts

## 1. හැඳින්වීම

1978 අංක 02 දරණ අධිකරණ සංවිධාන පනත හා 1979 අංක 15 දරණ අපරාධ නඩු විධි විධාන සංග්‍රහයන් අදාල වේ .

## 2. බලතල හා කාර්යයන්

1. මහේස්ත්‍රාත් අධිකරණය සම්පූර්ණයෙන්ම අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කරයි .

2. වරදක් නිර්වචනය කරන පනත් මගින් වරද විභාග කිරීමේ බලය මහේස්ත්‍රාත් අධිකරණයට පවරා ඇති අවස්ථා වල හා අපරාධ නඩු විධි විධාන සංග්‍රහයේ 1 අප ලේඛනයේ 8 තීරුවේ මහේස්ත්‍රාත් අධිකරණයක විභාග කළ හැකි බව දැක්වේ .

3 . මහේස්ත්‍රාත් අධිකරණයකදී නියම කළ හැකි උපරිම දඬුවම

- අවුරුදු 2ක දෙයාකාරයෙන් එක් ආකාරයක සිර දඬුවමක්
- රු : 1500 ක දඩයක්
- කස පහර දීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ප්‍රාථමික අධිකරණය - The Primary Courts

## 1 . හැඳින්වීම

1978 අංක 02 දරණ අධිකරණ සංවිධාන පනතින් හඳුන්වා දෙන ලදී . 1979 අංක 44 දරණ ප්‍රාථමික නඩු විභාග පනතින් බලතල විස්තර කරයි .

## 2 . බලතල හා කාර්යය

- ලිඛිත විධිවිධානයන්ට යටත්ව සුළු සිවිල් හා සුළු අපරාධ නඩු
- ණය , අලාභ ,ඉල්ලීම් , රු.1500 නොඉක්ම වූ විට මුල් සිවිල් අධිකරණ බලය
- පළාත් ආයතන වල අතුරු ව්‍යවස්ථා ක්‍රියාවේ යෙදවීම හා ආදායම් සම්බන්ධ කාරණා
- ප්‍රාථමික අධිකරණයකදී සෑමවිටම විනිශ්චයකාරවරයා පාර්ශවයන් අතර ආරවුල් සමථයකට පත් කිරීමට වෑයම් කිරීම .

## 3 . අභියාචනය

අතෘප්තිමත් පාර්ශවයකට මහාධිකරණයට අභියාචනා කළ හැක

# ළමයා යනු කවරේද?

ඔක්ස්ෆර්ඩ් විශ්ව ශබ්ද කෝෂයේ ''වැඩිවිය මට්ටමට වඩා අඩු වයසේ සිටින තරුණ මානවයා ළමයෙකු ලෙස සැලකේ'' යනුවෙන් ළමයා පිළිබඳව නිර්වචනය කර ඇත.

අදාළ නීතියේ වැඩිවියට පත්වීම කලින් දක්වා නොමැති නම් අවුරුදු 18 ට අඩු සෑම මානවයෙක් ම ළමයෙක් වේ. 1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය 1989 නොබැඳි ජාතීන්ගේ මණ්ඩලය විසින් සම්මත කළ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුකූල වෙමින් ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය මෑතක දී කළ සංශෝධන මඟින් ද ළමයා යනු වයස අවුරුදු 18ට අඩු තැනැත්තෙකු ලෙස අර්ථ කථනය කරයි

**උදාහරණ :-**

1 1988 අංක 28 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනතේ 280 (2) වගන්තිය අනුව ''ළමයා'' යනු වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙකි.

2.1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතේ 286 (2) වගන්තිය අනුව ''ළමයා'' යනු වයස අවුරුදු 18ට අඩු තැනැත්තෙකි.

3. 1998 අංක 88 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිළිබඳ පනතේ 39 වගන්තිය අනුව ''ළමයා'' යනු වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙකි.

මේ හැර ළමයා යනු වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙකු බවට සඳහන් කරන තවත් මූලාශ්‍ර ගණනාවකි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය විවාහ හා දික්කසාද නීතියට අනුව පුරුෂයෙකු හෝ කාන්තාවක් හෝ විවාහ වීමට සුදුසුකම් ලබන්නේ අවුරුදු 18 සම්පූර්ණ කළ පසුවය.

ශ්‍රී ලංකාවේ වයෝ පූර්ණත්වය නීතිය වැඩිහිටි වයසට එළඹෙනුයේ වයස අවුරුදු 18 සම්පූර්ණවීමෙන් බවට සලකයි.

මෙලෙස ශ්‍රී ලංකාවේ වලංගු නීතිය ''ළමයින් ලෙස අර්ථ නිරූපණය කරන්නේ වයසු අවුරුදු 18 සම්පූර්ණ කරන තැනැත්තන්ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ළමයින්ට අදාළ කරුණුවල දී මීට වඩා වෙනස් අර්ථ නිරූපණයක් දක්වා අර්ථකථනය කර තිබේ

- ළමුන් හා යෞවනයන් පිළිබඳ පනත අනුව වයස අවුරුදු 14 ට අඩු අය ළමුන් වේ.
- කාන්තාවන්, යෞවනයන් හා ළමුන් සේවයේ යෙදවීමේ පනතට අනුව ළමයා යනු අවුරුදු 14ට අඩු පුද්ගලයෙකි.
- 1997 අංක 100/35 දරණ රජයේ ගැසට් පත්‍රයට අනුව වයස අවුරුදු 14 ට අඩු ළමුන් අනිවාර්යෙන් ම පාසල් යැවිය යුතුය. මේ අනුව පාසැල් යන ළමයා ලෙස මෙහි අර්ථ නිරූපණය කර ඇත්තේ වයස අවුරුදු 14 ට අඩු තැනැත්තෝය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නීතියට අනුව ළමයෙකුගේ අවම වයස

ඉහත නීති සහ ලංකාවේ වලංගු වෙනත් නීති අනුව ළමයෙකුගේ උපරිම වයස අවුරුදු 18 කි. ළමයෙකු අයත් වන අවම වයස් කාණ්ඩයෙන් අවම වයස නිශ්චය කර ගැනීමේදී දණ්ඩ නීති සංග්‍රහයේ පහත සඳහන් වගන්ති ඉතා වැදගත්ය.

1. දරුවෙකු ඉපදීමට පෙර හෝ ඒ දරුවා පණ ඇති ඉපදීම වැළැක්වීමේ හෝ එම දරුවා ඉපදීමෙන් පසු ඔහුගෙන් හෝ ඇයගෙන් මරණය සිදු කිරීමේ අදහසින් යමෙකු යම් ක්‍රියාවක් කරනු ලැබේ. එම ක්‍රියාව පණ ඇතිව දරුවාගේ ඉපදීම වළක්වතොත් හෝ එම දරුවා ඉපදීමෙන් පසු ඔහුගේ මරණය සිදු කරතොත් එම ක්‍රියාව කිරීමේ අපරාධ වරදට දඩයකින් ද නැතහොත් ඒ දඬුවම් දෙකම මඟින් ද දඬුවම් කළ හැක. (දණ්ඩ නීති සංග්‍රහය 306 වගන්තිය)

2. යම් ක්‍රියාවකින් මවකගේ මරණය සිදු කළ හොත්, යමෙකු එම ක්‍රියාව කොට, ගැබ මේරූ නමුත් නොඉපදුණු දරුවෙකුගේ මරණය හා එහි ක්‍රියාවන් සිදු කළහොත් ඔහුට අවුරුදු 10 ක් දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතුය. ඔහු දඩයකට ද යටත් කළ යුතුය. (දණ්ඩ නීති සංග්‍රහය 304 වගන්තිය)

මෙම වගන්තිය අනුව මවකගේ කුසෙහි කළලක් හටගත් අවස්ථාවේ සිට එම ජීවියා, නීතිය විසින් දරුවෙකු ලෙස සලකන අතර එම ජීවියාට ජීවත් වීමේ අයිතිය නීතිය විසින් පිළිගන්නා බව පැහැදිලි වේ. මෙලෙස කළල අවස්ථාවේ සිට කුස තුළ ජීවත් වන ජීවියා දරුවකු වශයෙන් හඳුන්වයි. ඉන්පසු දරුවා, ළදරුවා, ළමයා, බාලවයස්කරුවා වැනි විවිධ යෙදුම් වලින් හඳුන්වන වයස අවුරුදු 18 ට අඩු සියලුම තැනැත්තන් යනුවෙන් ලංකාවේ වලංගු නීතිය අනුව ළමයින් ලෙස අර්ථ කථනය කරයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ළමයින්ගේ මානසික හා චර්යා ස්වභාවයන්.

ළමයා යනු විශ්වය විසින් නිර්මාණය කරන ලද අපූර්වත ම නිර්මාණයකි. එවැනි ළමයින් පහත සඳහන් මානසික හා චර්යා ස්වභාවයෙන් යුක්තය .

1. ඉතා සංවේදී, දූඩි සේ මව්පියන්ගේ හා හිතවතුන්ගේ ආදරය අපේක්ෂාකරන්නන්.
2. කරුණාව හා දයාවට ලක්විය යුත්තන්,
3. මවුපියන්ගේ මෙන් ම සමාජයේ ද රැකවරණයට ආරක්ෂාවට ලක් විය යුත්තන්,
4. මනස මෝරා නොමැත්තන්.
5. අනුකරණය කිරීමට දක්ෂයන් හා කැමති වූවන්,
6. එම හේතු නිසා නිතර අනතුරු සිදු කරගන්නන්, අන් අයට ද අනතුරු සිදු කිරීමට පෙළඹෙන්නන්.
7. ස්වාධීනත්වය, නිදහස බලාපොරොත්තු වන්නන්,
8. ඉගෙනුමට, විවිධ කුසලතාවයන්ට දක්ෂයන්,
9. සමාජයේ, පරිසරයේ පවුල් පසුබිමේ තත්ත්වය අනුව වෙනස් වන යහපත හෝ අයහපතට යොමු වන්නන්,
10. ලිංගික හැඟීම් දරාගන්නට නොහැක්කන්,
11. වහා ලිංගික ආශාවන්ට පෙළඹෙන්නන්,
12. ඕනෑම අයහපතකට, නපුරුකට, අපරාධයකට පහසුවෙන් හුරු කළ හැක්කන්.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ඉහත සඳහන් ආකාරයේ මානසික හා චර්යා ස්වභාවයේ යුක්ත දරුවන් රටේ අනාගත ජීවනාලිය වන අතර ඔවුන් රැකබලා ගැනීම ඔවුන්ගේ භාරකරුවන්ගේ යුතුකමකි.

# ළමයෙකුගේ භාරකරුවන්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ළමයෙකුගේ භාරකාරත්වය පිළිබඳ සලකා බැලීමේ දී එය කොටස් කීපයකට බෙදා දැක්විය හැකිය.

- **සජීවී භාරකරුන්**

ළමයෙකුගේ සජීව භාරකරු යනු ළමයාගේ මව සහ පියාය. තම මවට හෝ පියාට වුව ද ළමයෙකුට කෲරකම් කළ නොහැක.

- **තාවකාලික භාරකරුවන්.**

දරුවන්ගේ තාවකාලික භාරකරුවන් ගැන කතා කිරීමේ දී අද වන විට වැඩි වශයෙන් ම ළමුන් හිංසනයට පත්ව ඇත්තේ ද, ඒ අදාළ පාරිශවයන්ගෙන්ය. ගුරුවරුන්, ළමයා භාර දී සිටින නෑදෑයන්, මෙහෙකරුවන්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන භාරකරුවන්, වෑන් රථ රියදුරන්, මෙම තාවකාලික භාරකරුවන් ලෙස පිළිගැනේ. කෙසේ හෝ ළමයාගේ භාරකාරත්වය, ආරක්ෂාව දෙමව්පියන් විසින් ලබා දෙන ඕනෑම අයකු තාවකාලික භාරකරුවන් ලෙස පිළිගැනේ

- **ළමයාගේ නීත්‍යානුකූල භාරකාරත්වයි**

**අදාළ ප්‍රදේශයේ මහේස්ත්‍රාත් උසාවිය**